# නිවේදනය

**<u>ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට සීමිත පදනම මත බඳවා ගැනීම</u>**

අංක 2231 හා 2021.06.04 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය අනුව, ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට 2020/2021 සීමිත පදනම මත නව නිලධාරීන් බඳවා ගැනීමේ ලිඛිත තරඟ විභාගයේ හා වාචික පරීක්ෂණයේ ප්‍රතිඵල මත මේ සමඟ ඇති ඇමුණුමෙහි නම් සඳහන් නිලධාරීන් 405 දෙනා 2025.09.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින් තීරණය කර ඇති බව එම කමිටුවේ ලේකම්ගේ අංක: ESC/APP/SLEAS/01/25/2021(II) හා 2025.08.14 දිනැති ලිපිය මඟින් දැනුම් දී ඇත.

02. ඒ අනුව, පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබූ නිලධාරීන් 2025.09.01 වන සඳුදා දින පෙ.ව. 8.00 ට පත්වීම් ලිපි ප්‍රදානෝත්සවය සඳහා ඉසුරුපාය, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත, ඒ සඳහා වන කැඳවීමේ ලිපිය සහ ජාතික හැඳුනුම්පත හෝ අනන්‍යතාවය සහතික කළ හැකි ලේඛනයක් සහිතව සහභාගී විය යුතු වේ.

03. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක: PSC/EST/05-03/03/2019 හා 2020.01.01 01/2020 හි සඳහන් විධිවිධාන අනුව ඔබගේ පත්වීමට අදාළව සුදුසුකම් පරීක්ෂා කිරීමේ දිනය වන 2021.07.30 දින සිට මේ දක්වා විනයානුකූලව දඬුවමක් ලබා තිබේ ද/ චෝදනා පත්‍රයක් නිකුත් කර තිබේ ද යන්න තහවුරු වන ලේඛනයක් ඇමුණුම 01 පරිදි කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් සම්පූර්ණ කරවා ගෙන පත්වීම් ලිපි ප්‍රදානය සිදු කරන දිනයේ දී ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ. එම ආකෘති පත්‍රය ඉදිරිපත් නොකරන නිලධාරීන් වෙත එදින පත්වීම් ලිපි ප්‍රදානය කිරීම සිදු නොකරන බව ද කාරුණිකව දන්වා සිටිමි.

04. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාවේ 12.2.(ii) වගන්තිය ප්‍රකාරව නවක නිලධාරීන් වෙනුවෙන් පවත්වනු ලබන සේවාරම්භක පුහුණුව 2025.09.02 දින සිට ආරම්භ වන බැවින් ඒ සඳහා ද නිලධාරීන් සූදානම්ව පැමිණිය යුතු වේ.

05. තවද, 2025 සැප්තැම්බර් මස සිට ඔබගේ මාසික වැටුප බැරවිය යුතු ගිණුමට අදාළ තොරතුරු ඇමුණුම 03 ආකෘතිය අනුව සම්පූර්ණ කර එදිනට ඉදිරිපත් කිරීම ද අනිවාර්ය වේ.

නාලක කලුවැව
ලේකම්